(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(1).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 පෙබරවාරි 03 බදාදා**

---

**2021 පෙබරවාරි 12 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා.53/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/2021

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/2021

ගරු රෝහණ බංඩාර මහතා,— දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පණගැන්වීම,— වර්තමානය වනවිට දේශීය බීජ නිෂ්පාදනය විදේශීය සමාගම්වල ග්‍රහණයට හසු වී තිබෙන හෙයින් ද, එමඟින් දේශීය කෘෂි කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල අත් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම,— රටක අනාගත පරපුරට එම රටේ ඉතිහාසය ඉතා වැදගත් වන හෙයින් ද, වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන්ට සිදු වන හානි සම්බන්ධ සිදුවීම් රාශියක් වාර්තා වී ඇති හෙයින් ද, අනාගත පරපුර වෙනුවෙන් වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම,— වයඹ පළාතේ සැළකිය යුතු පිරිසක් කෘෂි කර්මාන්තයේ නිරත වන හෙයින් ඔවුන්ගේ හෙට දවසේ සුරක්ෂිතතාවය සඳහා අමිල සම්පතක් වන එම පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— එල්ලේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— එල්ලේ ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ක්‍රීඩාව වන හෙයින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ක්‍රීඩා සංගම්වල කටයුතු විධිමත් කිරීම,— වර්තමානය වනවිට ක්‍රීඩා සංගම්වල නිලතල දරන පුද්ගලයන් ක්‍රීඩාවේ ප්‍රගමනයට කටයුතු කිරීම පසෙක දමා සිය පෞද්ගලික අරමුණු සඳහා කටයුතු කරන හෙයින් ක්‍රීඩා සංගම්වල කටයුතු නිරන්තරයෙන් විමර්ශනයට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/2021

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නගරවලින් පිටතට බන්ධනාගාර රැගෙන යාම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ බොහෝ බන්ධනාගාර නගර ආශ්‍රිතව පිහිටා තිබෙන හෙයින් ද, ඒවා තුළ දැඩි තදබදයක් පවතින හෙයින් ද, මෙම බන්ධනාගාර නගරවලින් පිටතට රැගෙන ගොස්, එම පරිශ්‍රවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/2021

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද නියෝග අවලංගු කිරීම,— (222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 සහ 3 වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය විසින් සාදන ලදුව, 2020 අප්‍රේල් 11 දිනැති අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග අවලංගු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් නව ජාතික ආදර්ශ පාසලක් බවට පත්කිරීම,— ශ්‍රී ලංකාවේ වාසය කරන ජන වර්ග අතර ජාතික ඒකාබද්ධතාවය ගොඩනැංවීම සඳහා සෑම ජන වර්ගයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට භාෂාත්‍රයෙන් අධ්‍යාපනය ලැබිය හැකිවන පරිදි නේවාසික පහසුකම් ද සහිතව අනුරාධපුර නගරයේ ප්‍රධාන පාසලක් සංවර්ධනය කර නව ආදර්ශ ජාතික පාසලක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— මන්නාරම-අනුරාධපුර මාර්ගය සංවර්ධනය කොට යළි විවෘත කිරීම,— තිස් අවුරුදු යුද සමයේ දී වසා දැමුණු අනුරාධපුර සිට ඇලයාපත්තුව, පේමඩුව, මන්නාරම් හංදිය, සිලාවතුර සහ මන්නාරම දක්වා දිවෙන අබලන් තත්ත්වයේ පවතින ප්‍රධාන මාර්ගය, මන්නාරම සිට භාණ්ඩ සහ මාළු ප්‍රවාහනයට ද, ගමනාගමනයට මෙන්ම කොළඹ ඇතුළු ප්‍රධාන නගර සියල්ලටම ළඟාවිය හැකි පහසුම සහ කෙටිම මාර්ගය වන හෙයින් ද, අනුරාධපුර හා මන්නාරම දිස්ත්‍රික්ක අතර සෘජු සබඳතා මෙන්ම ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කරන හෙයින් ද, මේ සම්බන්ධව පුළුල් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකොට මාර්ගය සංවර්ධනය කර කඩිනමින් යළි විවෘත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/2021

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/2021

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි තේ කර්මාන්ත ක්‍රමය වෙනුවට කුඩා තේ වතු ක්‍රමයක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ තේ වගාව, වැවිලි ක්‍රමයට අයත් තේ වතු හා කුඩා තේ වතු ක්‍රමයට අයත් තේ වතු ලෙස දෙයාකාර වන හෙයින් ද, මින් වැවිලි ක්‍රමය මේ වන විටත් බිඳවැටෙමින් පවතින හෙයින් ද, වතු වැවිලි ක්‍රමය මඟින් සිදු කරන තේ වගාව, කුඩා තේ වතු ක්‍රමය දක්වා වෙනස් කොට එම වතුවල සේවය කරන කම්කරුවන්, කුඩා තේ වතුවල හිමිකරුවන් බවට පත් කොට ඒවා දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/2021

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/2021

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/2021

ගරු කිංස් නෙල්සන් මහතා,— මහවැලි ගොවිපොළ ජාලය ශක්තිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුව උදෙසා දැවැන්ත ජවයක් ලබා දෙන මහවැලි යෝජනා ක්‍රමය මඟින් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින ගොවිපොළ රජය විසින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2021 පෙබරවාරි 23 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1353/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට 2019.11.16 දින දක්වා කාලය තුළ දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීම සඳහා පත්කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) එම කොමිෂන් සභාව පවත්වාගෙන යාම වෙනුවෙන් රජය විසින් දරන ලද සමස්ත වියදම කොපමණද;

(iii) එම කොමිෂන් සභාවේ සභාපති සහ එක් එක් සාමාජිකයාගේ වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සභාපතිවරයා ඇතුළු ඉහත කොමිෂන් සභා සාමාජිකයන් මේ වනවිට රජයේ තනතුරු දරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයා විසින් දරනු ලබන රජයේ තනතුරු සඳහා මාසිකව ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1354/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සහ අග්‍රාමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1355/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ ජනාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1356/2020

ගරු අනුර දිසානායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ටින් මාළු තොග, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආපසු හරවා යවා තිබේද;

(ii) එසේ නම්, එසේ ආපසු හරවා යවන ලද දිනය, ප්‍රමාණය සහ ආපසු හරවා යැවීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ආපසු හරවා යවන ලද ටින් මාළු තොග ආනයනය කරන ලද ආයතනවල හෝ පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1357/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 දෙසැම්බර් 31 දින වනවිට "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට" එකතු වී ඇති මුළු මුදල කොපමණද;

(ii) එම අරමුදලින් වියදම් කරන ලද මුදල, එක් එක් ශීර්ෂයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අරමුදල හා කොවිඩ්-19 වසංගතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතුවලට වියදම් කරන ලද මුදල කොපමණද;

(iv) කොවිඩ් -19 වසංගතය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ ප්‍රචාරක කටයුතු සිදු කරන ලද ආයතන කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් ආයතනයට "ඉටුකම කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලෙන්" ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 පෙබරවාරි 24 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1358/2020

ගරු අනුර දිසානායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2020 වර්ෂයේදී සමූපකාර තොග වෙළඳ සංස්ථාව සහ සීමාසහිත ලංකා සතොස ආයතනය විසින්—

(i) මිලදී ගන්නා ලද සීනි තොග ප්‍රමාණය කොපමණද;

(ii) එම සීනි තොග මිලදී ගන්නා ලද දින කවරේද;

(iii) සීනි තොග ලබා ගන්නා ලද ආයතන සහ ප්‍රමාණ කවරේද;

(iv) එම සීනි කිලෝග්‍රෑම් එකක ගැනුම් මිල කොපමණද;

(v) සීනි කිලෝග්‍රෑම් එකක් අළෙවි කළ සිල්ලර මිල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2020 වර්ෂය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ සීමාසහිත ලංකා සතොස ආයතනයේ ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1359/2020

ගරු අනුර දිසානායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 සහ 2020 වර්ෂ සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාව සහ සීමාසහිත ලංකා සතොස ආයතනය ප්‍රචාරක කටයුතු වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රචාරණ දැන්වීම් නිෂ්පාදන කිරීම හා ප්‍රචාරණය කිරීම සඳහා ලබා දී ඇති ආයතන සහ ඒ වෙනුවෙන් එම එක් එක් ආයතනයට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1360/2020

ගරු අනුර දිසානායක මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2020 දක්වා කාලය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කහ ප්‍රමාණය;

(ii) ආනයනය කරන ලද එක් එක් රට අනුව කහ ප්‍රමාණය;

(iii) කහ ආනයනය කිරීම සඳහා දරන ලද වියදම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1361/2020

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගාවලින් හා වැලි නිධිවලින් වැලි ඉවත් කිරීම සඳහා මේ වනවිට ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් බලපත්‍ර ලබා දී ඇති වැලි තොටුපොළවල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද වර්ෂය සහ බලපත්‍රලාභියාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2019 හා 2020 වර්ෂවලදී ඉහත සඳහන් එක් එක් බලපත්‍රලාභියා විසින් ඉහත සඳහන් එක් එක් තොටුපොළින් ගොඩදමන ලද වැලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1362/2020

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති මහවැලි කලාපවලට අයත් වගා කිරීම සඳහා බෙදා දීමට සුදුසු ඉඩම් ප්‍රමාණය එක් එක් මහවැලි කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂය තුළදී එසේ හඳුනාගත් ඉඩම්වලින් වගා කිරීම සඳහා ලබා දී තිබෙන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් ලබා දී ඇති පුද්ගලයන්ගේ/ආයතනවල නම් කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයාට හා ආයතනයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් මහවැලි කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 අප්‍රේල් 06 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවා ගැනීමට 2020 වර්ෂයේදී ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවාගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවාගැනීමේදී මෙම උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් දුම්රිය ප්‍රවාහනයට එකතු කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් දුම්රිය මැදිරි අතරින් දේශීයව නිෂ්පාදන කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව හා විදේශීය රටවලින් ආනයනය කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අප රට තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

108/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ලබා දෙන ත්‍රිපෝෂ පෝෂණ අතිරේකය ප්‍රමාණවත් හා විධිමත් පරිදි නොලැබෙන බවත්;

(ii) ළමා මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමක පැවතීමට මෙම තත්ත්වයද එක් හේතුවක් බවත්;

(iii) ඒ හේතුවෙන්, දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ත්‍රිපෝෂ කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද යන්න ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි ත්‍රිපෝෂ නිෂ්පාදනයට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

169/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

451/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරගහකන්ද-කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර උතුරු මැද පළාතට ජලය ලබාදීමේ පියවරක් වශයෙන් මේ වනවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයට ජලය ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ජලය ලබාදීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම යෝජනා ක්‍රම මඟින් හුරුළුවැවට හා කණදරාවැවට ජලය ලබාදීමේ යෝජනාවක් තිබේද;

(ii) එසේ නම්, එම යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

483/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ වගා බිම්වල පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබෙන බවත්;

(ii) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින රටක් බවට පත්ව තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කටයුතු සිදුකිරීම අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

544/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නායයාමේ අවදානම් සහිත දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඊට අවසර ලබාගත යුතු ආයතන කවරේද;

(ii) එම ආයතන මඟින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ක්‍රමවේද කවරේද;

(iii) එම ක්‍රමවේද අනුවම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබාදීම සිදුවන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නායයාමේ අවදානම් නොමැති දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී අදාළ පළාත් පාලන ආයතනවලින් පමණක් අනුමතිය ලබාදෙන බව එතුමා දන්නෙහිද;

(ii) එම දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අධීක්ෂණයක් සිදුවන්නේද;

(iii) අධීක්ෂණයක් සිදු වන්නේ නම්, ගොඩනැගිලි වර්ග කිරීමක් කර අනුමතිය ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

556/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෝජනා ක්‍රම මගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ ග්‍රාම නිලධාරී වසම්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ජල යෝජනා ක්‍රම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ජල යෝජනා ක්‍රම අවසන් කිරීමට නියමිත කාල සීමාව එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑස් නම් ඒ මන්ද?

635/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ, පලුකාමම්, වීරච්චේනෙයි, මායාපුරම් සහ වන්නිනගර් යන ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානවල ජීවත්වන, උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා ජල නල එළිය යුතු දුර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ගම්මානවල පවතින පානීය ජල හිඟය විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2020

ගරු රවුෆ් හකීම් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ ආඥා පනත අනුව යම් භූමියක් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වනාන්තරය, රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කළ දිනය, එයට අයත් වන භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලග්ගල ප්‍රාදේශීය රෝහල අලුතින් ඉදිකිරීම සඳහා රජය විසින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝහල සඳහා අනුමත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ වනවිට එම රෝහලේ සේවයේ නිරත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vii) දැනට එම රෝහලේ පවත්වාගෙන යනු ලබන සායන වර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

838/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව, රජයේ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සාධාරණ අයුරින් වැඩි වී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් විශ්‍රාමිකයන් කළකිරීමට පත් වී ඇති බවත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවන අවසන් වැටුප මත විශ්‍රාම වැටුප් සැකසීමට නියමිතව තිබුණද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 ට අනුව 2017.01.01 දිනට අදාළව අදියර දෙකක් යටතේ වූ වැටුප මත පමණක් විශ්‍රාම වැටුප සැකසීම හේතුවෙන් 2016.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ගන්වනු ලැබූ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ, රණවිරුවන් ඇතුළු සියලුම රජයේ විශ්‍රාමිකයන්ට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවත්;

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවීමට නියමිතව තිබූ අවසන් වැටුප මත විශ්‍රාම වැටුප සැකසීමට කටයුතු කරන ලද්දේ නම්, 2020.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ලබාගත් රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් වීමෙන් ඔවුන්ට සාධාරණයක් ඉටුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 කඩිනමින් ක්‍රියාත්මක කර රජයේ විශ්‍රාමිකයන්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

877/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය සීමාවන් ඉක්මවා යමින් ණය නිකුත් කිරීමට පෙර නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය වශයෙන් නියම කර ඇති ණය ගැනීමේ සීමාව ඉක්මවා යමින් නිකුත් කරන ලද ණය ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද අනිකුත් ණය හා සමාන ලෙස ගෙවීම් පැහැර හැරීම පිළිබඳ සිදුවීම්කදී සලකනු ලැබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) 2020 අංක 1 දරන ජාතික අයවැය චක්‍රලේඛය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ක්‍රියාමාර්ග ගන්නා ලද්දේ ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අප්‍රේල් 07 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

27/2020

ගරු හේෂා විතානගේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකිරීම් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මේ දක්වා—

(i) ලැබූ ආදායම;

(ii) නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මෙතෙක් එහි පැමිණි ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානා අයත් වන ගුවන් සේවා ආයතන කවරේද;

(iii) එම කාලසීමාව තුළ මෙම ගුවන්තොටුපොළ හරහා ගමන් ගත් මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ගුවන්තොටුපොළ තවදුරටත් සංවර්ධනය සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

130/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මහ නගර සභා අතරින් කසළ ඉවත් කිරීම පෞද්ගලික ආයතන වෙත භාර දී ඇති මහ නගර සභා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නගර සභාවල කසළ ඉවත් කිරීම භාරගත් පෞද්ගලික සමාගම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සමාගම් වෙත ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පළාත් පාලන ආයතනවල සේවකයන් යොදවා සිය පළාත් පාලන බලප්‍රදේශයේ කසළ ඉවත් කරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති පොදු ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මේ වනවිට දස වසරක් ගත වී තිබුණ ද, එම ක්‍රීඩාංගණය දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා මේ දක්වා භාර දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත මුදලින් පසුගිය වර්ෂ 10 තුළදී වැය කර ඇති මුදල කොපමණද;

(iv) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) කොන්ත්‍රාත් කටයුතු සිදු කරන වර්තමාන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රමාදය, දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කටයුතුවලට කෙතරම් දුරට බලපා තිබේද;

(ii) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා කටයුතු නංවාලීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

229/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි පිටි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි පිටි ආනයනය කළ රටවල්වල් කවරේද;

(iv) එම  කිරි පිටි ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට  කිරි පිටි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

266/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ඇති මාර්ග රක්ෂිතය තුළ පදිංචිව සිටින්නන් පිළිබඳව සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) මාර්ග රක්ෂිතයෙන් එම පවුල් ඒකක ඉවත් කර වෙනත් ස්ථානයක පදිංචි කරවීමට සැලසුමක් තිබේද;

(iv) එසේ නම්, ඔවුන් පදිංචි කරවීමට අපේක්ෂා  කරන ප්‍රදේශය කවරේද;

(v) ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා  මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

485/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අළෙවි මණ්ඩලය ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් වී අළෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ මිලදී ගත් වී ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික අංශයේ වෙළඳුන් විසින් ගොවීන්ගෙන් අඩු මිලට වී මිලදී ගැනීම වැළැක්වීම සඳහා වී අළෙවි මණ්ඩලය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) කුලියාපිටිය මූලික රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ සායනික පුහුණුවීම් සඳහා යොදාගැනීමට කටයුතු කරන්නේද;

(ii) මේ සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා කුලියාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධව මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(ii) එම ඒකකය කුලියාපිටිය රෝහලේ ස්ථාපනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1352/2020

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෙර පැවති අළුත්ගම සහ දර්ගා නගරය යන සුළු නගර සභා බලප්‍රදේශවලට අයත් ප්‍රදේශ, මුහුදු මට්ටමට වඩා පහතින් පිහිටා තිබීම හේතුවෙන් නිතර නිතර ජල ගැලීම්වලට ලක් වූ බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට සහ ඔවුන්ගේ දේපලවලට සිදු වන හානිය වැළැක්වීමේ අරමුණින් 1993 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ එම ප්‍රදේශ සඳහා මතුපිට කානු පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බවත්;

(iii) එම ව්‍යාපෘතියේ පළමු අදියර අළුත්ගම ප්‍රදේශය ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලද නමුත්, එහි දෙවන අදියර මේ වනතෙක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව තවදුරටත් පීඩාවට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වන වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අප්‍රේල් 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

68/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිවසක් ඉදිකර ගැනීම සඳහා ඉඩමක් නොමැති පවුල් 6579ක් රත්නපුර දිස්ත්‍රික්කයේ සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පවුල් සඳහා නිවාස ඉදිකිරීමට අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය රාජ්‍ය වතු සමාගම් සන්තකයේ ඇති ඉඩම්වලින් ලබා ගැනීමට රජය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ සම්බන්ධව රජය විසින් ගැනීමට අපේක්ෂිත විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

135/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල්වල පිහිටි ශ්‍රී ලංකාවේ විදේශ ගත රාජ්‍ය දූත මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දූත මණ්ඩල පිහිටි රටවල් හා නගර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් දූත මණ්ඩලයේ සේවය කරන සේවක සංඛ්‍යාව සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සේවකයන් අතරින් සෘජුවම ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගැනීමේ විභාගයෙන් සමත් වූ නිලධාරින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකා විදේශ සේවයට සෘජුවම අයත් වන සේවක සංඛ්‍යාව, විදේශ දූත මණ්ඩලවල සේවය කරන සමස්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(vi) විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරින් වැඩි වශයෙන් බඳවා ගැනීමට අමාත්‍යාංශය ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

267/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි පුහුණුව ලද ඉංජිනේරු සහකාර දෙවැනි කණ්ඩායමේ අභ්‍යාසලාභින් 71 දෙනෙකු මේ වනතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බවත්;

(ii) මේ වනවිට ඔවුන්ගේ පුහුණුව අවසන් වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(iii) ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව සේවය කළ ද, ඔවුන්ට නිසි වැටුප් ගෙවීමක් සිදු නොකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අභ්‍යාසලාභින් ස්ථිර සේවයට බඳවා ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

301/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 මැයි මාසයේදී කැළණි ගඟ පිටාර ගැලීමෙන් කොළඹ දිස්ත්‍රික්කයට බලපාන ලද ගංවතුර හේතුවෙන් පීඩාවට පත් ජනතාව සඳහා ගෙවන ලද වන්දි මුදල;

(ii) කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිව සිටින ඉහත ගංවතුර හේතුවෙන් පීඩාවට පත් වූ එහෙත් අදාළ වන්දි මුදල් නොලැබුණු පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බලා රු. 20,000/- බැගින් වන්දි ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති බව එතුමා දන්නෙහිද?

(ii) එසේ නම්, එම වන්දි මුදල් ගෙවනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම වන්දි මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශිය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශිය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවාගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමේ, බඹරඇල ග්‍රාමයේ 1973 වර්ෂයේ සිට හේන් ගොවිතැන් කරන ලද ගොවීන්ගේ සින්නක්කර ඔප්පු සහිත ඉඩම්වලට වනජීවි නිලධාරින් පැමිණ රක්ෂිත මායිම් සළකුණු කර මායිම් කණු දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

547/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හබරාදූව, අක්මීමන, ගාල්ල සහ රත්ගම යන ප්‍රදේශවලට දැඩි පානීය ජල ගැටලුවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රශ්නයට විසඳුම වන මාගාල්ල ජල යෝජනා ක්‍රමයේ ඊළඟ අදියර සඳහා ඉදිරි අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඉහත කී ප්‍රදේශවල පවතින පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

558/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දේවහුව ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි ගල්බොක්කයාය නම් ගමෙහි, ගලේවෙල-කලා වැව පාරේ, බුලන් වැව ගල් කොරියට හා ප්‍රධාන මාර්ගයට යාබදව ඇති භූමිය, රක්ෂිතයක් බැවින් එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන බවත්;

(ii) 2020.09.22 වන දින අලුයම් කාලයේදී සංවිධානාත්මක පිරිසක් විසින් ඉහත භූමිය තුළ ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ඉදිකිරීම් කීපයක් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉදිකිරීම් සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් වගකිව යුතු රාජ්‍ය නිලධාරියකු හෝ ආයතනයක අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නොඑසේ නම්, මෙම ඉදිකිරීම් ඉවත් කර රක්ෂිතය ආරක්ෂා කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

577/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහවැලි ''එල්'' කලාපය සඳහා මුලතිව් හා වවුනියා දිස්ත්‍රික්කවලින් අත්පත් කර ගත් ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න හෙක්ටයාර්වලින් හා ප්‍රතිශතයක් ලෙස එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1984 වර්ෂයේදී බලහත්කාරයෙන් ඉවත් කරන ලද මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි, කොක්කුත්තොඩුවායි, කර්නාට්ටුක්කේණි ගම්මානවල ජීවත් වූ, දෙමළ ජනතාව, යුද්ධයෙන් පසු එම ගම්මාන වෙත පදිංචියට ගිය විට ඔවුන්ගේ ඉඩම්වල සිංහල ජනතාව පදිංචිව සිටි බවත්;

(ii) දෙමළ නම්වලින් හැඳින්වූ ගම්මාන හා වැව් සඳහා සිංහල නම් යොදා තිබූ බවත්;

(iii) දෙමළ ජනතාවගේ බලපත්‍ර සහිත ඉඩම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දේශපාලඥයන්ගේ ඥාතීන් හා ධනවතුන්ට දීර්ඝ කාලීන බද්දට ලබාදී තිබූ බවත්;

(iv) ඉහත ගම්මානවල ජනතාව සිය ඉඩම්වල ගොවිතැන් කිරීමේදී, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් බාධා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ මහවැලි ''එල්'' කලාපයට අයත් සිංහල ජනතාව පදිංචි ඉඩම් හැර ඉතිරි ඉඩම්, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කොට්ඨාසය වෙත පවරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

581/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තෙල්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මාබේරිතැන්න රජයේ සත්ව ගොවිපොළ, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) විසින් පාලනය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොවිපොළෙහි සේවය කරනු ලබන කාර්යාලීය නිලධාරින් සංඛ්‍යාව සහ කම්කරුවන් සංඛ්‍යාව;

(ii) පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව;

(iii) පිහිටා ඇති කම්කරු ජනාවාස හා ලයින් සංඛ්‍යාව;

(iv) පිහිටා ඇති මුළු ලයින් කාමර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගොවිපොළෙහි, ලයින් කාමරවල පදිංචි වී සිටින පවුල් සඳහා තනි නිවාස ඉදිකිරීමට පසුගිය කාලයේදී ඉඩම් ලබා දුන් බව එතුමා දන්නෙහිද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිපොළෙහි පදිංචි වී සිටින එහෙත් ලයින් කාමරවල පදිංචි වී නොසිටින පවුල් සඳහා ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

607/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබා දෙනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසි මාසික දීමනාව රු.2000.00 සිට රු. 2500.00 දක්වා වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම වැඩි කරනු ලබන දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) විදේශ වන්දනා ගමන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අඩු පොලියට ණය ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේනම්, එය සම්බන්ධීකරණය කරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

727/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එවකට බලයේ සිටි ජනාධිපතිවරයා විසින් 2013 ජනවාරි 15 අගවිනිසුරු ධූරයට ව්‍යවස්ථානුකූලව පත් කරන ලද මොහාන් පීරිස් මහතාගේ පත්කිරීම, පසුව අවලංගු හා බල ශූන්‍ය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මොහාන් පීරිස් මහතාගේ අගවිනිසුරු ධූරය සඳහා වූ එම පත්කිරීම, අවලංගු හා බලශූන්‍ය කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

770/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන අර්ධ රාජ්‍ය පාසල් සිය අරමුණුවලට පටහැනිව යමින් අසල්වැසි ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ළමුන් බඳවානොගන්නා බව එතුමා දන්නෙහිද ?

(ආ) එසේනම්, කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් අර්ධ රාජ්‍ය පාසැල සම්බන්ධයෙන්—

(i) පාසලේ නම කවරේද;

(ii) ආගමික හෝ ආගමික නොවන ලෙස වර්ගය කවරේද;

(iii) ජාතිය හා ආගම පදනම් කොට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එක ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා අනුමත ඉංග්‍රීසි ප්‍රමුඛ කොටගත් ද්විභාෂික පංති සංඛ්‍යාව කොපමණද;

(v) අසල්වැසි ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ළමුන්ට වෙන්කොට ඇති කෝටාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත කී පාසැල් සම්බන්ධයෙන්—

(i) පළමු ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පංති පැවැත්වීමට අවසර ලබාදී තිබේද;

(ii) පළමු ශ්‍රේණියට බඳවාගැනීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ අනුගමනය නොකළ හැක්කේ මන්ද;

(iii) පවත්නා ඇතුලත් කරගැනීමේ ක්‍රියාවලිය, විනිවිදභාවය හා කාර්‍යසාධනය පිළිබඳ රජය සෑහීමට පත්වන්නේද;

(iv) ඉගෙනුම් හා කලමනාකරණ ක්‍රමවේද විධිමත් කිරීමට රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

777/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පදිංචිව සිටින ඉඩම් ඔප්පු හිමිකම් නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සඳහා ඔප්පු ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

839/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අතරින් කොවිඩ්-19 වෛරසය—

(i) ආසාදනය වූ;

(ii) ආසාදනයෙන් පසුව සුව වූ;

(iii) ආසාදනයෙන් පසු මරණයට පත් වූ;

(iv) හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකාවට පැමිණි;

ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කරන රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වෛරසය ආසාදනය හේතුවෙන් මේ වනවිට රැකියා අහිමි වූ විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කළ රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ට සහන සැලසීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයට ගොදුරු වූ විදෙස්ගත ශ්‍රමිකයන් තම පවුල්වලට මුදල් නොඑවීමෙන් ආර්ථික අපහසුතාවයට පත් පවුල්වලට සහන සැලසීමට ගත් පියවර කවරේද;

(iv) එම වසංගතය හේතුවෙන් විපතට පත් විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සඳහා අදාළ රටවල තානාපති කාර්යාලවලට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අප්‍රේල් 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන මඟින් විශාල රැකියා සංඛ්‍යාවක් බිහි කරමින් ජාතික නිෂ්පාදනයට සෘජු හා වක්‍ර ලෙස දායක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන, අනු ශාඛා සහ ගෘහස්ථ මධ්‍යස්ථාන;

(ii) මේ වනවිට වසා දමා ඇති ප්‍රධාන, අනු ශාඛා සහ ගෘහස්ථ මධ්‍යස්ථාන;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (ii)හි සඳහන් මධ්‍යස්ථාන වැසී යාමට බලපෑ කරුණු කවරේද;

(ii) එමඟින් අහිමි වූ රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානවල වාර්ෂික පිරිවැටුම කොපමණද;

(ii) මෙම මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ බලය ඇති ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

200/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක අමාත්‍යාංශය මේ වනවිට පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය කවරේද;

(ii) එම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික කුලිය කොපමණද;

(iii) එම අමාත්‍යාංශය රජය සතු ගොඩනැගිල්ලක් වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

317/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මළල ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ මළල ක්‍රීඩා හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මළල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

438/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය වෙනුවෙන් ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටුවීමේදී දිස්ත්‍රික් පදනම හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම සැලකිල්ලට ගෙන තිබේද;

(iii) එම මධ්‍යස්ථානවලින් පුහුණුව ලබා වාර්ෂිකව පිට වී යන තරුණ තරුණියන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(iv) සාර්ථකව පුහුණුව නිම කරනු ලබන තරුණ තරුණියන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(v) නොඑසේ නම්, ඔවුන්ගේ අනාගතය සාර්ථක කරන විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

528/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති උතුරු මැද පළාත් සභාව යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් කවරේද;

(iii) එම පාසල්වල දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානය තුළ මේ වනවිට ගබඩා කර තිබෙන වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගබඩාවලට අමතරව නව වී ගබඩා මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ගොවීන් සඳහා නොමිලේ පොහොර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් ගොවියෙකු සඳහා ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එසේ නොමිලේ ලබා දෙන පොහොර වර්ග කවරේද;

(iv) ඒ සඳහා රජය විසින් වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

590/2020

ගරු එස්.එම්.එම්.මුෂාරෆ් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති සුප්‍රසිද්ධ සංචාරක කලාපයක් වන අරුගම්බේ වෙරළ ප්‍රදේශය, මුහුදු රළ මත ලිස්සා යෑමේ ක්‍රීඩාව සඳහා ලෝකයේ පවතින මුල් ස්ථාන 10 අතරට අයත් වන බව දන්නෙහිද;

(ii) එසේ නම්, අරුගම්බේ ප්‍රදේශය මේ වනතෙක් සංචාරක කලාපයක් බවට ප්‍රකාශයට පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන ස්ථානයක් වූ අරුගම්බේ ප්‍රදේශයේ සංචාරකයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, සංචාරකයන් සඳහා ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් සැපයීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති දෙමළ ජාතික නියෝජිතයන් බහුතරයක් සිටින ප්‍රාදේශීය සභා, නගර සභා ලෙස උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

642/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ පිහිටි පහළ මල්වතුඔය ජලාශය ඉදිකිරීම සඳහා හිටපු අග්‍රාමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, චීන සමාගම යන ආයතන දෙක අතරින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු චීන සමාගම විසින් සිදු කරනු ලබන්නේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

722/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික්කයේ ජනතාවට සෞඛ්‍ය සේවා සපයන මන්නාරම දිස්ත්‍රික් රෝහලේ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල ඉතා පැරණි බවත්;

(ii) එම රෝහලේ බාහිර රෝගී අංශය සහ දැඩි සත්කාර ඒකකය ඉදිකරන බවට පසු ගිය කාලයේදී පොරොන්දු වුවද, මේ වනතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බොහෝ වෛද්‍ය පරීක්ෂණ එම රෝහලේ සිදු නොකරන බවත්;

(ii) සී.ටී. ස්කෑන් (CT SCAN), ස්නායුවේද (NEUROLOGY), උගුර - කණ - නාසය (ENT), විකලාංග (ORTHOPAEDIC), නියෝප්ලස්මාවේදය (ONCOLOGY), මෛත්‍රික රෝග චිකිත්සාව (UROLOGY), වෘක්කවේදය (NEPHROLOGY), වක්ත්‍ර, මුඛ හා හනුකවේදය (OMF) යන ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මෙම රෝහලේදී සිදු කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඈ) ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මන්නාරම දිස්ත්‍රික් රෝහල තුළ සිදු කිරීම, නැවත ආරම්භ කළ හැකිද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

729/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල සිට ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හරහා දඹුල්ල දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

732/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ රටකට භාණ්ඩ අලෙවිය සඳහා ඇති පහසුම ක්‍රමය "ඊ-කොමර්ස්" (E-Commerce) වෙබ් අඩවියක් හරහා සිදු කරන අලෙවිය වන බැවින් මේ සඳහා ලෝකයේ මිලියන 305ක පමණ ජනතාවක් "පේපැල්" (PayPal) "ගේට්වේ" (Gateway) භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශයන්ට අලෙවි කිරීමේ දී ඉහත ක්‍රමය භාවිතා කළ හැකි බවත්;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ක්‍රමය ශ්‍රී ලංකාවේ විවෘත කර නොතිබීමෙන් භාණ්ඩයක්/සේවාවක් විදේශයන්ට අලෙවි කර, විදේශ විනිමය ලැබිය හැකි ආදායම් මාර්ග ඇහිරී ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාවේ ඇති "ඔන්ලයින්" (Online) ක්‍රමයට සේවා සපයන ආයතන, විදේශීය ලිපිනයන් භාවිතා කරමින් "පේපැල්" (PayPal) ගිණුම් සකස් කරන බවත්;

(v) මේ හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල මුදලක්, කොමිස් වශයෙන් විදේශයන්ට ගෙවීමට සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/සේවාවන් "ඔන්ලයින්" (Online) ක්‍රමයට විදේශයන්ට අලෙවි කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

773/2020

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ජාත්‍යන්තර පාසල් පිහිටුවීමේදී, ගුරුවරුන් බඳවාගැනීමේදී, ගාස්තු අයකිරීමේදී සහ වෙනත් කටයුතුවලදී එකී පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1276/2020

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී හදිසි සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි චීනයේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල ඉහළ නිලධරයෙකු වන යන්ග් ජියේචි (Yang Jiechi) මහතා ඇතුළු චීන නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා හමුවීමට හේතු කවරේද;

(ii) එම හදිසි සංචාරය තුළින් ශ්‍රී ලංකාවට සහන හා ආධාර ලැබී තිබේද;

(iii) ඉහත හදිසි සංචාරයට අදාළ සුවිශේෂ කරුණක් තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/2020

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පූජ්‍ය උඩවලවේ අමරවංශ හිමියන් 2008.11.06 දින සිට ර/බෝපිටිය විද්‍යාලයේ උප ගුරුවරයකු ලෙස සේවය කරන ලද බවත්;

(ii) අසත්‍ය අපචාර චෝදනාවක් මත එම හිමියන්ව අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හේතුවෙන් එම හිමියන්ගේ වැඩ තහනම් කර සේවය අවසන් කළ බවත්;

(iii) මේ සම්බන්ධ නඩු විභාගයෙන් පූජ්‍ය අමරවංශ හිමියන් නිදොස් කොට නිදහස් වීම හේතුවෙන් සේවය බිණ්ඩනය වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා ඇති බවත්;

(iv) එහෙත් එම හිමියන්ට මේ වනතෙක් හිඟ වැටුප් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම හිමියන්ගේ හිඟ වැටුප් ගෙවන්නේද;

(ii) පූජ්‍ය අමරවංශ හිමියන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝගයක් ලබා දී නොමැති බැවින් එම හිමියන් සමඟ පත්වීම් ලද අනෙකුත් ගුරු සහායකවරුන්ගේ පත්වීම් ස්ථිර කරන ලද දිනය වන 2012.03.31 දින සිට පූජ්‍ය අමරවංශ හිමියන්ගේ පත්වීමද ස්ථිර කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 අප්‍රේල් 20 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

36/2020

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සිට 2019 දක්වා වර්ෂවලදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය;

(ii) ඒ අනුව එම වර්ෂවලදී සහල් ආනයනය සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල;

එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී වර්ෂවල සහල් ආනයනයේ කිරීමේදී සහල් කිලෝවක් සඳහා අය කරන ලද බදු මුදල;

(ii) ඉහත වර්ෂවලදී සහල් ආනයනය සඳහා අය කරන ලද මුළු බදු මුදල් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත වර්ෂවලදී සහල් මිල උච්චාවචනය වූයේ කවර ආකාරයෙන්ද යන්න වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් පූර්ණ වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

203/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාවේ නව අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජික/ සාමාජිකාවගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තරුණ සංවර්ධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

230/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ දැව ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම දැව ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම දැව ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට දැව ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

539/2020

ගරු රෝහණ බංඩාර මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි තර්ජනයට මුහුණ දී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව හා දේපළ හානි සිදුවීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

603/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 308 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ආසිරිගම මාර්ගයේ කාගොල්ලෑව හන්දියේ සිට කටුකැලියාව හන්දිය දක්වා කිලෝ මීටර් 2 ක පමණ දුර ප්‍රමාණයකින් යුක්ත වූ කොටස ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාදු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

717/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩකයන් සංචිත ගත කර පුහුණුව ලබා දීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සංචිත සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචිත පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා කවරේද;

(iii) මළල ක්‍රීඩාව සඳහා වන ජාතික සංචිතය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

(iv) එම සංචිතයේ මේ වනවිට පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී තිබේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

753/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ සිට පොළොන්නරුව දක්වා ධාවනය කරනු ලබන දුම්රිය, මඩකලපුව දක්වා ධාවනය නොකිරීමට හේතු කවරේද;

(ii) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුම්රිය මාර්ග පිළිසකර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

763/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වන —

(i) අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) ජාතික පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) පළාත් පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මෙම පාසල්වල මේ වනවිට පවතින ගුරු හිඟය කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ වැසී ගිය පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල් අතරින්—

(i) අ.පො.ස. (උ/ පෙළ) සඳහා අදාළ වන විෂය ධාරා හතරක්, විෂය ධාරා තුනක්, විෂය ධාරා දෙකක්, හා එක් විෂය ධාරාවක් පමණක්;

(ii) අ.පො.ස. (සා/ පෙළ) විභාගය දක්වා;

(iii) පහ ශ්‍රේණිය දක්වා;

ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන්, උපාධිධාරී ගුරුවරුන්, පුහුණු ගුරුවරුන්, විද්‍යාපීඨ ගුරුවරුන් හා අනෙකුත් ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

771/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් 2019.04.21 සිට සිය ගණනක් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවාතබා ගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් 2019.04.21 දින සිට 2019.11.16 දින දක්වා සහ 2019.11.17 සිට මේ දක්වා කාලය තුළ—

(i) විමර්ශන සඳහා භාරයට ගත් සංඛ්‍යාව කොපමණද ;

(ii) රඳවාගැනීම් නියෝගය දීර්ඝ කරමින් රඳවාතබාගෙන සිටින සංඛ්‍යාව කොපමණද ;

(iii) චෝදනා පත්‍ර ගොනුකොට උසාවියට ඉදිරිපත් කළ සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) (i) නිදහස් කොට, ඇප ලබාදී හෝ නිදොස් කොට ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) පවතින විමර්ශන ක්‍රියාවලිය පිළිබඳව රජය තෘප්තිමත් වන්නේද;

(iii) සුළු චෝදනා මත රඳවා සිටින පුද්ගලයන් නිදහස් කිරීමටත්, දීර්ඝ කළ රැඳවුම් නියෝග මත සිටින සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

791/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ගොවිබිම්වල නිදිකුම්බා ශාකය ව්‍යාප්ත වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම නිදිකුම්බා ශාකය ව්‍යාප්තිය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

806/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධි සේවක පදනම මත දිවයින පුරා පාසල්වල පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවයේ යෙදී සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් විදුහල්පතිවරුන්ට—

(i) පත්වීම් ලබා දෙන ලද දිනය;

(ii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(iii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම විදුහල්පතිවරුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(ii) ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දින වකවානු;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

832/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ලද පළමු වර්ෂය කවරේද;

(ii) එම වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති මුළු සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iii) 2014.12.31 දින වනවිට ශ්‍රී ලංකාවට ලැබී තිබූ මුළු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් ආයෝජන වටිනාකම එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

850/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ මහවැලි කලාපවල—

(i) මුළු භූමි ප්‍රමාණය;

(ii) වී වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iii) අතිරේක භෝග වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iv) මුඩු බිම් ප්‍රමාණය;

එක් එක් කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ මහවැලි කලාපවල පදිංචි —

(i) මුළු පවුල් ඒකක සංඛ්‍යාව;

(ii) එම සියලු පවුල් ඒකකවල මුළු සාමාජිකයන් සංඛ්‍යාව;

එක් එක් කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?